දෙවන කලාපය
ISSN - 1391-6785

# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි

පලවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජූලි - දෙසැම්බර්

## තේ වගාවේ සින්ක් භාවිතය

සින්ක් තේ ගසට අත්‍යාවශ්‍ය පෝශකයකි. එය ඉතාමත් සුළු ප්‍රමාණවලින් තේ ගස ලබාගත්තත් එයින් තේ ගසේ පැවැත්මට සහවර්ධනයට ලැබෙන පිටිවහල අනෙකුත් ප්‍රධාන පෝශක හා සමානව ම වැදගත් වේ. තේ ගස නිමි තේ කිලෝ ග්‍රෑම් එකක් නිපදවන විට පසෙන් සින්ක් මිලි ග්‍රෑම් 80 ක් ඉවත්වේ. මෙ නයින් බලන කල නිමි තේ කිලෝ ග්‍රෑම් 2500 ක් නිපදවන ඉඩමකින් අවුරුද්දකට සින්ක් ග්‍රෑම් 200 ක් ඉවත් වි යයි.

සාමාන්‍ය පොහොර මිශ්‍රණ වලින් පං[illegible]න්ක් එකතු නොකරන නිසා දිගුකාලීනව තේ ඉඩම්වලින් සින්ක් විශාල ප්‍රමාණයක් ඉවත් වී යයි. මේ නිසා තේ ගස් වල සින්ක් ඌණතා ලක්ෂණ පහලවීම නොවැලැක්විය හැකිය. වංගි හෙවත් අක්‍රිය අංකුර බහුලව ඇතිවීම, දැකැති හැඩැති පත්‍ර සහ දාරය ඉහලට නැවුනු පත්‍ර ඇතිවීම සින්ක් ඌණතාව පහසුවෙන් හඳුනාගත හැකි ලක්ෂණවේ. මේ ලක්ෂණ තවාන්වල මෙන් ම නොමේරූ සහ මේරූ තේ වගා වල දැකිය හැක. මේ ඌණතාවය මග හැරවීමට ක්‍රියානොකල හොත් අස්වැන්න සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවිය හැක.

හයවන පිටුවට.. ..

සාමාන්‍යයෙන් තේ දළු කිලෝ ග්‍රෑම් එකක සින්ක් මිලි ග්‍රෑම් 10 සිට 30 අතර සාන්ද්‍රණයක් පවතී. සාමාන්‍යයෙන් පසේ පවතින ගසට ලබා ගත හැකි සින්ක් සාන්ද්‍රණය පස් කිලෝ ග්‍රෑම් එකකට සින්ක් මිලි ග්‍රෑම් 1 සිට 5 ක් පමණ වේ. පස්වල සින්ක් බහුල ලෙස පවතින්නේ ගසට ලබා ගත නොහැකි ආකාරයටය. ගස්වලට ලබාගත හැක්කේ පාංශු ද්‍රාවණයේ දිය වූ සහ මැටි හා කාබනික කලිල වලට ලිහිල් ලෙස බැඳුණු සින්ක් පමනි. මේ නිසා සින්ක් පස තුලින් ශාකයට ලබා දීම එතරම් යෝග්‍ය කටයුත්තක් නොවේ. වඩාත් කාර්යක්ෂම වන්නේ සින්ක් පත්‍ර මතට ඉසීම මගින් ලබා දීමය.

සින්ක් තේ ගසේ ඇතැම් එන්සයිම සමග බැඳී පවතින අතර බොහෝ එන්සයිම ක්‍රියාවලින් ක්‍රියාත්මක කිරීම සඳහා ඉවහල් වේ. විශේෂයෙන් ම ප්‍රභාසංස්ලේෂණයේ දි කාබන් තිර කිරීම, පිෂ්ඨ සහ ප්‍රෝටීන් පරිවෘත්තිය, අංකුර වර්ධනය සඳහා වන හෝමෝන ක්‍රියාවලින් උත්ප්‍රේරණය කරයි.

තේ වගාවට නියමිත ආකාරයට සින්ක් යෙදීමෙන් අස්වැන්න 15- 20% ප්‍රමාණයකින් වැඩිකර ගත හැක.
එම නිසා ඔබේ තේ ඉඩමට නොවරදවාම නිර්දේශිත පරිදි සින්ක් සල්පේට් යොදන්න.
සින්ක් සල්පේට් යෙදීමට තේ පර්යේෂණායතනය නිර්දේශ කරන්නේ පහත සඳහන් පරිදිය.

ඉඩමේ හෙක්ටයාරකින්, අවුරුද්දකට අමු දළු කිලෝ ග්‍රෑම් 10,000 කට වඩා අඩු අස්වැන්නක් ලැබෙන විට සින්ක් සල්පේට් කිලෝ 1.5 බැගින් වතුර ලීටර් 400 ක මිශ්‍රකර අවුරුද්දකට හතර වතාවක් පත්‍ර මතට ඉසින්න.

ඉඩමේ හෙක්ටයාරකින්, අවුරුද්දකට අමු දළු කිලෝ ග්‍රෑම් 10,000 කට වඩා වැඩි අස්වැන්නක් ලැබෙන විට සින්ක් සල්පේට් කිලෝ 2.75 බැගින් වතුර ලීටර් 400 ක මිශ්‍රකර අවුරුද්දකට හතර වතාවක් පත්‍ර මතට ඉසින්න.

පසට නියමිත පොහොර මිශ්‍රණ යොදා සති දෙකකට පමන පසු සින්ක් සල්පේට් ඉසීම කල යුතුය.

ආචාර්ය කපිල සොයිසා